


# කිට්ටියාට පාඩමක්...


පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# කිට්ටියාට පාඩමක්...




**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : කිටියාට පාඩමක්...

ප්‍රථම මුද්‍රණය : 2023.11.15

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 1 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-206-955-5

පරිගණක අක්ෂර, පිටු සැකසුම හා වර්ණ ගැන්වීම්
අධීක්ෂණය : සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- මම ආසයි ඉගෙනගන්න...
- කැළෑ ගමේ ගිනි නිවන හමුදාව
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 1 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී  ගුරු මෑණියන්ටත්,

එම ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ISBN කේත ලබාගැනීම සඳහා නොමඳ සහයක් ලබා දුන්

4 ශ්‍රේණියේ සතිනි දියණියගේ මව වන

ලුම්බිණි මහත්මියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත් සහ

මල්ලීට

මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

අපේ කිට්ටියා හරිම නරකයි
කියන දෙයක් නම් අහන්නේ ම... නෑ...
ඔයාල දන්නවද එයා කරන වැඩ?



එයා ගෙදර වටේ ම ගෙවල්වල පූසෝ එක්ක හරිම තරහයි. රණ්ඩුත් වෙනවා.



අත්තම්මාගේ කරවල කූඩේ පෙරළලා ඒකෙන් හැමදාම
කරවල හොරෙන් කනවා.

අත්තම්මාගෙන් ගුටිත් කනවා.



මම කුරුල්ලන්ට කන්න බත් දාන ලෑල්ලට එන පුංචි කුරුල්ලන්ව අල්ලාගෙන කනවා.

මට නම් හරිම තරහයි, එයාගේ මේ නරක වැඩවලට.

අනේ මන්දා... එයා කවද හැදෙයිද කියලා...

අත්තම්මා නම් කියන්නේ එයා, අපායේ යන්න පාර හදා ගන්නවා කියල...




ඒත්, එක දවසක් හරි වැඩක් වුනනේ එයාට...


අපේ ගෙදරට ගේ හදන්න බඩු වගයක් අරන් පෙරේරා මාමාගේ ලොරිය ආවා.

අපේ නරක කිට්ටි බඩු ටික බෑවට පස්සේ ඒ ලොරියට නැගලා,

අපි කවුරුත් ඒක දැක්කේ නෑ.


බඩු ටික බාලා පෙරේරා මාමා ලොරියේ පිටිපස්සේ දොරත් වහලා ලොරියට නැගලා යන්න ගියා.





අය්යෝ...

අපේ කිටී ලොරිය ඇතුළේ, ඒත් අපි කවුරුත් ඒක දැක්කෙ නෑ...



ඔන්න දවල් කෑමවෙලාවට අපි කිටීට කතා කළා.

කිටී... කිටී...

ඒත් කිසිම සද්දයක් නෑ. කෝ අපේ කිටී. කෝ එයා.

අපි හැමෝම කිටීව හෙව්වා.

කෝ... නෑනේ එයා.


අපිට හරිම පුදුමයි. කෝ... අපේ කිටී...

රෑ වෙන්නත් ළඟයි කිටී තාමත් නෑ.

කිටී එදා රෑ ගෙදර ආවෙ නෑ...

මටයි ගෙදර හැමොටමයි දුකයි කිටී නැතුව.

අප්පච්චියි අම්මයි කිව්වා අපි එයාව කොහොම හරි හොයාගමු කියල



පහුවදා උදෙත් වෙලා...

අදත් අපි කිට්ටී ගැන කතා වුනා එයාව ඉක්මනට හොයාගන්න.


ඔය වෙලාවෙ තමයි, මල්ලි එයාගේ සෙල්ලම් ලොරිය පෙන්න පෙන්න මොනවදෝ කිව්වේ එයා පොඩ්ඩියිනේ කතා කරන්න බෑ...

මල්ලි අයෙත් එයාගේ සෙල්ලම් ලොරියේ උඩින් එයාගේ රබර් පූසාව තියලා...

ඕ... ඕ... ඝඳාම්... ඕ... බ්‍ර්...ර්...ර්... අතක් දික් කරගෙන ලොරිය තල්ලුකරගෙන රවුමක් ගියා.

දැන්නේ මට තෙරුනේ...

මල්ලි කියන්නේ කිට්ටී පෙරේරා මාමාගේ ලොරියට නැග්ගා ඊටපස්සේ ලොරිය ගියා කියලා.



මම වෙලා තියන හැමදේම අම්මටයි අප්පච්චිටයි කිව්වා.
මල්ලි දක්ෂයා... එය මගේ මල්ලිනේ...

එයා ඔක්කොම දැකලා.

එහෙනම් අනිවාර්යෙන් ම කිටී ඉන්න ඕන පෙරේරා මාමා ලොරිය නවත්තන හන්දියේ.

මමයි අප්පච්චියි ඉක්මනට හන්දියට ගියා...

අපේ ගෙදර බල්ල බුලට් අපිත් එක්ක ආවා.

එයා ඉව කරලා  බැලුවා.

ඔන්න මේ හරියේ කිටී ඉන්නවනම් බුලට් එයාව හොයාගනී දෝණි. අප්පච්චි මට කිව්වා.




ඒක හරියටම හරි.

හන්දිය ළඟ තියන ලොකු ගහ යට විසි කරලා තිබුන පරණ කාඩ්බෝඩ් පෙට්ටියක් අතුළේ ඉදලා කිටීව බුලට් හොයා ගත්තා.

අපිට හරිම සතුටුයි. එයා කරදරයක් නැතුව ඉන්නවා. ඒත්, මඩ නෑවිලා කිලුටුත් වෙලා බයත් වෙලා හිටියේ.

ඊට පස්සේ අපි ඔක්කෝම ගෙදර ගියා .



දැන් නම් කිටී පාඩමක් ඉගනගෙන වගේ දඟ වැඩ හරිම අඩුයි.

ඔන්න ඔහොම තමයි යාළුවනේ අපේ නරක කිටී හොඳ කිටියෙක් වුනේ. ඒවගේ ම තමා, අපි නරක වැඩ කළොත් අපිට කවදා හරි කොහොම හරි ඒකට දඬුවම් ලැබෙනවා කියලත් අපි ඉගන ගන්න ඕන...



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

9 786242 069555